කැලණිය අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2016
කතෝලික ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය: 2**

**නම: ..........................................................** **පංතිය .....................**

---

## I කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

01. ''ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න එසේ කිරීමෙන් ඔබට සෙත සැලසෙනු ඇත.'' මෙසේ සඳහන් වන ලිපිය වන්නේ

i. ගලාති ii I කොරින්ති iii එපීස iv. රෝම

02. ක.ස.ධ. 2096 වගන්තියට අනුව මැවිල්ල පිළිබඳව සඳහන් වන්නේ,

(i) දෙවි සමිඳාණන්ට පමණක් වන්දනා කරන්න.
(ii) දෙවි සමිඳාණන් ලෝකය මැවූ බව
(iii) විශ්වය මත මිනිසාගේ යුතුකම්
(iv) මිනිසා මැවිල්ලේ කොටසක් බව

03. දේව වචනය පිළිබඳ අපට අදාල නොවන වාක්‍ය වන්නේ

(i) ශුද්ධ ලියවිල්ලේ දේව වචනය ඇති බව ජේසුස් වහන්සේ පිළිගත් සේක.
(ii) ශුද්ධ ලියවිල්ල දිනපතා කියවන ලෙස ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක.
(iii) ජේසුස් වහන්සේ ජනතාවට ශුද්ධ ලියවිල්ල ඉගැන්වූ සේක.
(iv) ජේසුස් වහන්සේ ශුද්ධ ලියවිල්ල අධ්‍යනය කළ සේක.

04. ලන්දේසි පීඩන සමයේ කතෝලික ආගම රැකගත් නිකාය වන්නේ කුමක්ද?

i. ජේසු නිකාය ii අගොස්තීනු නිකාය iii ඔරතෝනියානු නිකාය iv. දොමිනිකන් නිකාය

05. දේව රාජ්‍යයේ වටිනාකම ගැන සඳහන් වන උපමාව තෝරන්න

a. මුතු ඇටය b. නිධානය c. වපුරන්නා d. අබ ඇටය

i. a,c ii. b,d iii. c,d iv a,b

06. 'පාළුකරයේ මොර ගසන හඬ' ස්නාවක ජොහාන් තුමා බව ප්‍රකාශ කළ දිවැසිවරයා කවුද?

i. යෙසායා ii ජෙරමියා iii එසකියෙල් iv. දානියෙල්

07. ඊසාක් තුමා දේව ක්‍රියාකාරීත්වය අත්දුටු ස්ථානය කුමක්ද?

i. බෙතෙල් ii හෙබ්‍රොන් iii බෙයර් ෂෙබා iv. සියොන්

08. ලන්දේසීන්ගෙන් කතෝලික ජනතාවට සිදුවූ පීඩා කවරේද?
(a) කතෝලික පියවරු රටින් පිටුවහල් කිරීම.
(b) කතෝලික දහම ඕලන්ද ප්‍රදේශ වල තහනම් කිරීම.
(c) කතෝලික පල්ලි ගිනිබත් කිරීම.
(d) කතෝලික ජනයා හට සහනාධාර දීම.
i. a,b,d ii. b,c,d iii. c,b,d iv. a,b,c

09. ''දෙවියන් වහන්සේගේ ආහාරය වන්නේ ස්වර්ගයෙන් පහල වී ලෝකයට ජීවනය දෙන ආහාරයයි'' මෙලෙස සඳහන් වන්නේ
i. ශු. මාක් ii ශු. ලූක් iii ශු. මතෙව් iv. ශු. ජුවාම්

10. ක.ස.ධ. ට අනුව ක්‍රිස්තියානි නිවාසය වනාහි ........... සම්පූර්ණ කරන්න
(i) ප්‍රේමයේ සංඝයකි
(ii) සහයෝගයේ පරමාදර්ශයකි
(iii) ගෘහික සභාවකි.
(iv) එකමුතුකමේ ගෘහයකි.

11. බෞස්තිස්ම ස්නාපනීය වරප්‍රසාද වර්ධනය කරන සක්‍රමේන්තුව
i සමගි සන්ධානය ii දිව්‍ය සත්ප්‍රසාදය iii රෝගීන්ගේ ආලේපය iv. අභිවෘද්ධි ආලේපය

12. ප්‍රසාද ස්නාපනය පිළිබඳ නිවැරදි වැකිය තෝරන්න
(i) සභාව තුළ පරිණත භාවය ලැබේ.
(ii) සියලුම පාපයන් පවිත්‍ර නොකරයි.
(iii) නව මැව්ල්ලක් බවට පත් නොවේ.
(iv) පියාණන් වහන්සේගේ පුත්‍රභාවය ලැබේ.

13. ශු. පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර භාරය වන්නේ,
(i) මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගමි.
(ii) මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න.
(iii) මරණයේ බලයට වුවද එය පරාජය කළ නොහැක.
(iv) සීමෝන් ඔබ මට ප්‍රේම කරන්නෙහිද?

14. ඔබේ දෙවි සමිදාණන් වහන්සේට ............. හා ඔබේ මුළු සිතින් ප්‍රේම කරන්න
i. මුළු හෘදයෙන් ii. මුළු ධනයෙන් iii.මුළු ආත්මයෙන් iv. මුළු ජීවිතයෙන්

15. ගීතාවලිය 23 වන පරිච්ඡේදය මුල් කරගෙන තැනූ ගීතිකාවකි.
(i) දේව වචනයේ බලය ඔබම වේ.
(ii) නිල් තණගොල්ලේ මා සතපන්නෝ
(iii) මා සඳහා දිවි පිදුවේ
(iv) ජීවිතේ මට දුන්නු දෙව් තුමනේ

16. අමාශා, ශු. ස්තේපන් තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශයක් ඉදිරිපත් කළාය. ඇය දුන් නිවැරදි පිළිතුර වන්නේ,
(i) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම.
(ii) මරණයට බියෙන් පලා ගියේය.
(iii) පළමු ප්‍රාණපරිත්‍යාගවරයා ස්තේපන් තුමාය.
(iv) උපස්ථායකයන්ගේ නායකත්වය ස්තේපන් තුමාට බාර නොවීය.

17. මිනිසා කෙසලනු ලැබීමට හේතුව කටට ඇතුළු වන දේ නොව කටින් පිටවන දේය.
මෙලෙස සඳහන් වන සුවිශේෂය වන්නේ
i. ශු. මතෙව්     ii ශු. ලූක්     iii ශු. මාක්     iv. ශු. ජුවාම්

18. ශු ත්‍රිත්වය, මෙලොව දර්ශනය වූ අවස්ථාව වන්නේ
i. ලෝකය මැවීම   ii. මාංශගතවීම iii බෞෂ්තිස්ම ස්නාපනය   iv අන්‍ය රූප විලාස වීම

19. පහත සඳහන් වගන්ති වලින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ අසත්‍ය ප්‍රකාශය කුමක්ද?
(i) ශු. ජස්ටින් තුමා දිව්‍ය සත්ප්‍රසාදය පිළිබඳ ප්‍රකාශ කරන ලදි
(ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජේසුස් වහන්සේ ජීවමානව වැඩ සිටින සේක.
(iii) දෙවන ශතවර්ෂයේ සිට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ජීවමානව බව කථා කරයි.
(iv) අතිඋතුම් ෆ්‍රැන්සිස් පාප්තුමා දිව්‍ය සත්ප්‍රසාදය උතුම් බව පවසා ඇත .

20. 2015/2016 ජනවන්දනා වර්ෂය නම් කර ඇත්තේ,
i. විශ්වාසයේ වසර     ii දයාවේ වසර
iii දේව වචනයේ වසර     iv. දේව ආදරයේ වසර

## II කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

**1.** "මිත්‍යා ඇදහිලි වලින් වැලකි දෙවි මිනිස් සබඳතා පූර්ණත්වයට පත් කරමු
යන මැයෙන් නිර්මාණය කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පිළිතුරු සපයන්න

i. මිත්‍යා ඇදහිලි 2ක් ලියන්න ල:2
ii. ඒවා මිත්‍යා ඇදහිලි යැයි ප්‍රකාශ කිරීමට හේතුවක් ලියන්න ල:2
iii. බිත්ති පුවත්පතට අවශ්‍ය තොරතුරු ගත් මූලාශ්‍ර 2ක් ලියන්න ල:2
iv. මිත්‍යා ඇදහිලි පිළිබඳ ව දස පණතේ කුමක් සඳහන් වේද? එය පහදන්න ල:2
v. පළමු පණත කඩ කරන ජනයා වෙනුවෙන් විශ්වාසකයන්ගේ යැදුමක් ලියන්න ල:3

(ලකුණු 16)

**2.** i. ලංකාවට පළමුවෙන් පැමිණි ධර්ම දූත කණ්ඩායමයත්, පැමිණි වර්ෂයත් ලියන්න ල:2
ii. පෘතුගීසි සමයේ පැමිණි පියවරුන්ගෙන් සිදුවූ සේවාවන් 3ක් ලියන්න ල:3
iii. රටක් ලෙස ස්භාවික ආපදා තත්වයන්ට මුහුණ දෙන මේ කාලය තුළ කතෝලිකයන් වශයෙන් අපගේ යුතුකම් 3ක් පැහැදිලි කරන්න ල:6

(ලකුණු 11)

**3.** i. මෝසස් තුමා හට අනාවරණය කරන ලද දේව නාමය කුමක්ද? ල:2
ii. පාළුකරයේදී ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා 3 ලියන්න ල:3
iii. ඉතා අලංකාරව අප වෙත පැමිණෙන පරීක්ෂා ලියා ඒවාට මුහුණ දෙන අයුරු පැහැදිලි කරන්න ල:6

(ලකුණු 11)

4. i. ශුද්ධාත්ම දීමනා 2ක් ලියන්න ලං:2
ii. සැත්තෑ දෙනාගේ ධර්මදූත සේවාවේදී ලබා දුන් උපදෙස් 3ක් ලියන්න ලං:3
iii. "ප්‍රසාද ස්නාපනීය කැඳවීම" මෙම මාතෘකාව පිළිබඳව රූල් 6කින් පමණ පැහැදිලි කිරීමක් කරන්න ලං:6
(ලකුණු 11)

5. i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගැන කියවෙන ගීතිකාවක මුල් පේළි 2 ලියන්න ලං:2
ii අන්තිම රාත්‍රී භෝජනයේදී සිදුවූ වැදගත් සිදුවීම් 3ක් ලියන්න ලං:3
iii. පූජාප්‍රසාදීන් වහන්සේලාගේ කාර්යභාරයන් 3ක් පැහැදිලි කරන්න ලං:6
(ලකුණු 11)

6. i. ජේසුස් වහන්සේගේ ජීවිතයේ අවු. 12-30 ත් අතර කාලය ගැන ශු.ලූක් තුමා ප්‍රකාශ කළ වැකිය ලියන්න ලං:2
ii. දෙමාපියන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් 3ක් ලියන්න ලං:3
iii. ඔබේ දෙමව්පියන් උදෙසා රූල් 6කින් පමණ යාච්ඤාවක් ලියන්න ලං:6
(ලකුණු 11)

7. i. "උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා ඇත."
(අ) මෙය ප්‍රකාශ කළේ කවුද?
(ආ) කාටද?
(ඇ) කුමන අවස්ථාවේද? ලකුණු 3
ii. පහත මාතෘකා 2ක් සඳහා කෙටි සටහන් ලියන්න
a. පන්සලේ පියතුමා
b. ගොන්සාල්වේස් පියතුමා
c. ශු. ජුසේවාස් පියතුමා
d. ශුද්ධෝතම පියතුමා
ලකුණු 8